# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2334/39 - 2023 ජුනි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2023.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.- බී 10/2013

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 24 වන වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2006 නොවැම්බර් මස 02 දින අංක 1469/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2006 අංක 2 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නියෝග, එම නියෝගවල උපලේඛනයේ (20) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"20. (1) මණ්ඩලය විසින් , -

(අ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි, මෙහි 1 වන වගුවේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකමක නිරතවන සහ ඒ වගුවේ II වන තීරයේ සහ III වන තීරයේ අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති අදාළවන සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරාලනු ලබන; හෝ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි, මෙහි 2 වන වගුවේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකමක නිරතවන සහ 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ විධිවිධානවලට යටත්ව එහි දේශීය කොටස් හිමිකාරිත්වය විදේශීය කොටස්කරුවකු වෙත පවරනු ලබන සහ ඒ වගුවේ II වන තීරයේ සහ III වන තීරයේ ඊට අනුරූපී සටහන්වල නිශ්චිතව දක්වා ඇති අදාළවන සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරාලනු ලබන,

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ විධිවිධාන යටතේ මණ්ඩලයේ අනුමතය ලබාගෙන නොමැති දැනට පවතින ව්‍යවසායක් සමග හෝ එකී පනතේ 16 වන වගන්තියේ විධිවිධාන යටතේ අනුමතය ලබාගෙන ඇති ව්‍යවසායක් සමග එකී පනතේ 17 වන වගන්තිය යටතේවන ගිවිසුමකට එළඹීමට හැකි ය.

## I වන වගුව

| *ක්‍රියාකාරකම* | *සුදුසුකම් ලැබීමේ නිර්ණායක* | |
|---|---|---|
| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
| | *ආයෝජනය* | *අපනයන ප්‍රතිශතය* |
| වක්‍ර අපනයන ඇතුළත්ව අපනයනය සඳහා නිෂ්පාදනය | (අ) අවම අතිරේක ආයෝජනය ඇමෙරිකානු ඩොලර් 250,000 ක් (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන; සහ<br><br>(ආ) නව අතිරේක ආයෝජනය ඇතුළු මුළු ආයෝජනය අමෙරිකානු ඩොලර් 500,000ක් (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) ඉක්මවිය යුතු වන. | එහි නිෂ්පාදනයෙන් සියයට අසූවකට (80%) නොඅඩු |
| සේවා අපනයනය | (අ) අවම අතිරේක ආයෝජනය ඇමරිකානු ඩොලර් 250,000ක් (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන; සහ<br><br>(ආ) නව අතිරේක ආයෝජනය ඇතුළු මුළු ආයෝජනය අමෙරිකානු ඩොලර් 500,000ක් (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) ඉක්මවිය යුතු වන. | එහි නිෂ්පාදනයෙන් සියයට හැත්තෑවකට (70%) නොඅඩු |
| හෝටල් කර්මාන්තයේ | (අ) හෝටල් හෝ ඊට අදාළ යම් ක්‍රියාකාරකමක් සඳහා අතිරේක ආයෝජනය ඇමරිකානු ඩොලර් 5,000,000 (ඇ.ඩො. මිලියන 5) (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන; හෝ<br><br>(ආ) අවම වශයෙන් අතිරේක කාමර 50ක් ඉදිකිරීම | – |
| මිශ්‍ර සංවර්ධනය | ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකමක් සඳහා අතිරේක ආයෝජනය ඇමරිකානු ඩොලර් 5,000,000 (ඇ.ඩො. මිලියන 5) (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන. | – |

2 වන වගුව

| *ක්‍රියාකාරකම* | *සුදුසුකම් ලැබීමේ නිර්ණායක* | |
|---|---|---|
| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
| | *ආයෝජනය ගලා ඒම* | *අපනයන ප්‍රතිශතය* |
| අපනයනය සඳහා නිෂ්පාදන | කොටස් පැවරුමේ අවම වටිනාකම ඇමරිකානු ඩොලර් 1,000,000ක් (ඇ.ඩො. මිලියන 1) (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන. | එහි නිෂ්පාදනයෙන් සියයට අසූවකට (80%) නොඅඩු |
| ඉදිකරමින් පවතින හෝටලය | කොටස් පැවරුමේ අවම වටිනාකම ඇමරිකානු ඩොලර් 5,000,000 ක (ඇ.ඩො. මිලියන 5) (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන. | – |
| ඉදිකරමින් පවතින මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති | කොටස් පැවරුමේ අවම වටිනාකම ඇමරිකානු ඩොලර් 5,000,000 ක (ඇ.ඩො. මිලියන 5) (හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඊට සමාන ප්‍රමාණයක්) වන. | – |

(2) මණ්ඩලය විසින්, 1978 ඔක්තෝබර් මස 31 වන දින අංක 8/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, සංශෝධිත පරිදි වූ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 1 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නියෝගවල 2 වන නියෝගයේ (vi) සහ (vii) ඡේදවල නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීම් හා වෙනස් කිරීම්, (1) වන අනු අයිතමය යටතේ එළඹෙන ලද යම් ගිවිසුමකට ඇතුළත් කළ යුතුය.

එසේ වුව ද, ගිවිසුමකට, ඉහත සඳහන් කරන ලද ඡේදවල නිශ්චිතව දක්වා ඇති නිදහස් කිරීම් සහ වෙනස් කිරීම් ඇතුළත් කිරීම මගින්, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ යම් ව්‍යවසායකට ලබා දී ඇති යම් ප්‍රතිලාභයක් හෝ වරප්‍රසාදයක් භුක්ති විඳීමේ අයිතියට අගතියක් නොවිය යුතු ය.

(3) (1) වන අනු අයිතමයේ කාර්යය සඳහා -

(අ) ස්ථාවර වත්කම් සහ කාරක ප්‍රාග්ධනය මත ආයෝජනය ගණනය කළ යුතු අතර එම ස්ථාවර වත්කම් සඳහා යෝජිත ආයෝජනයෙන් සියයට විසිපහක් (25%) දක්වා ව්‍යාපෘති ඉඩමේ වටිනාකමින් සපුරා ගැනීම ඇතුළත් විය හැකිය;

(ආ) ''වක්‍ර අපනයනය'' යන්නෙන්, අපනයනය කිරීම අරමුණු කරගත් භාණ්ඩ තවදුරටත් සකස්කර අපනයනය කිරීම සඳහා වෙනත් පාර්ශ්වයකට ලබාදීම අදහස් වේ.

EOG 06 - 0004

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.